**මහ කොළඹ ජලය හා අපජලය කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන - 02 ව්‍යාපෘතියේ (අඹතලේ බලශක්ති ඉතුරුම් ව්‍යාපෘතිය) - 2020**

---

මහ කොළඹ ජලය හා අපජලය කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන - 02 ව්‍යාපෘතියේ (අඹතලේ බලශක්ති ඉතුරුම් ව්‍යාපෘතිය) 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ එහි කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාත්‍රාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සහ ඒජනස් ෆැන්කයිස් ඩී.ඩිවිලොප්මන්ට් අතර 2014 සැප්තැම්බර් 29 දින එළඹි අංක සී.එල්.කේ.1008-01පී දරණ ණය ගිවිසුමේ 3.4.2(එච්)වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළයුතු යැයි මා සලකන මාගේ අදහස් සහ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය, වර්තමානයේ ජල සම්පාදන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. මහ කොළඹ ප්‍රදේශයේ ජල සැපයුම් ප්‍රවේශය පුළුල් කිරීම හා ජල පද්ධතියේ, තිරසාර බව පෝෂණය කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 13,000 කට සමාන එජඩො මිලියන 100 ක් වන අතර ඉන් රු.මිලියන 9,100 කට සමාන එජඩො මිලියන 70 ක් මූල්‍යනය කිරීමට ඒජන්ස් ෆැන්කයිස් ඩී.ඩිවෙලොප්මන්ට් එකඟවී තිබුණි. ඉතිරි රු.මිලියන 3,900 ක වටිනාකම ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යනය කිරීමට අපේක්ෂා කෙරේ. ව්‍යාපෘතිය එහි කටයුතු 2014 සැප්තැම්බර් 29 දින ආරම්භ කර තිබුණු අතර, 2019 දෙසැම්බර් 31 දින වන විට නිම කිරීමට සැලසුම්කර තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘති කාල සීමාව 2022 මැයි 31 දින දක්වා දීර්ඝ කර ඇත.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

---

මාගේ වාර්තාවේ 2.1 වගුවෙන් විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ව්‍යාපෘතියේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ක්‍රියාකාරිත්වය හා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

---

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම

2.1 ගිණුම්කරණ අඩුපාඩු

| අංකය | ගිණුම්කරණ අඩුපාඩු | වටිනාකම රු.මිලියන | කළමනාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශ |
| --- | --- | --- | --- | --- |
| (අ) | රු.මිලියන 133.63 ක විනිමය ලාභ ප්‍රමාණය මූල්‍ය ප්‍රභවයන් යටතේ වෙනම අයිතමයක් ලෙස පෙන්වනවා වෙනුවට කෙරීගෙන යන වැඩ ගිණුමෙහි වැරැදි ලෙස අඩු කොට තිබුණි. | 133.63 | 2021මූල්‍ය ප්‍රකාශනවල යෝජිත ගැලපීම සිදු කරනු ලැබේ. | මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ මූල්‍ය ප්‍රභවය යටතේ විනිමය ලාභ වෙනම පෙන්නුම් කළ යුතුය. |
| (ආ) | ව්‍යාපෘතිය වෙනුවෙන් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මගින් මහජන බැංකුව වෙත ගෙවන ලද ණය පොලී රු.මිලියන 83.53ක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වෙත ගෙන නොතිබුණි. | 83.53 | ව්‍යාපෘති ගිණුම් සම්පූර්ණ වන විට මෙම වටිනාකම ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ලෙජරයෙහි යාවත්කාලීන කර නොතිබුණි. පසුව අප ගණුදෙනුව ව්‍යාපෘති ගිණුම් වලට ගෙන එනු ලැබේ. | ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට ප්‍රථමව අදාළ ව්‍යාපෘති වියදම් හඳුනාගෙන ගිණුම් ගත කිරීමට පියවර ගත යුතුය. |
| (ඇ) | 2016 හා 2017 වර්ෂයන්හිදි රජයේ දායකත්ව ලැබීම් වලින් එකතු කල අගය මත බදු රු.මිලියන 77.74 ක් හිලව් කර තිබුණි. කෙසේ වෙතත්, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙහි 2021 පෙබරවාරි 12 දිනැති අංක 01-2021 දරන ගිණුම්කරන උපදෙස් චක්‍රලේඛයට අනුව එය මූල්‍ය ප්‍රකාශනයන්හි රජයේ දායකත්වයට ගෙනැවිත් නොතිබූ අතර එකතු කල අගය මත බදු ගිණුමෙහි වෙනම දක්වා නොතිබුණි. | 77.74 | 2021 මූල්‍ය ප්‍රකාශනයන්හි යෝජිත ගැලපීම සිදුකරනු ලබයි. | මූල්‍ය ප්‍රකාශනවල රජයේ දායකත්වය යටතේ ගිණුම් කලයුතු අතර එකතුකල කල අගය මත බදු ලෙස වෙනම පෙන්විය යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2020 දෙසැම්බර් 31 දක්වා කොන්ත්‍රාත්කරුවන්ගෙන් රු. මිලියන 1.14 ක ද්‍රවශීලතා අලාභ අඩු කර ගෙන තිබුණි. කෙසේ වෙතත් එය අදාළ වියදම් ගිණුම් වලින් අඩු කිරීම වෙනුවට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ අනෙකුත් වගකීම් වල නිරූපණය කර තිබුණි. | 1.14 | දැනටමත් ව්‍යාපෘතිය විසින් ගිණුම් පොත්වල නිවැරැදිව ඇතුලත් කිරීමට විගණකවරුන්ගෙන් උපදෙස් ඉල්ලා ඇත | තත්‍ය පිරිවැය දක්වා අඩුකිරීමට අඩුකරන ලද ද්‍රවශීලතා අලාභ අදාල වියදම් ගිණුම්වලට මාරු කල යුතුය. |
| (ඉ) | ව්‍යාපෘතිය විසින් මීටර් 13,691 ක කාපට් ආවරණය කිරීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරියට සහ පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට රු.මිලියන 403 ක් ගෙවා තිබුණද, 2020 දෙසැම්බර් 31 දින දක්වා කාපට් ආවරණය කර තිබුණේ මීටර 588 ක් පමණි. මීටර 13,103 ක කාපට් ආවරණ වැඩ සඳහා රු.මිලියන 383 ක අතිරේක මුදලක් කෙරීගෙනයන වැඩ ගිණුමට වැඩියෙන් හර කර තිබුණි | 383 | පෙර කොන්ත්‍රාත්කරුගේ (අවම ලංසුකරු) සුභද අවසන් කිරීම සහ දෙවන අඩුම ලංසුකරු වෙත කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම හේතුවෙන් ජාතික ජල සම්පාදන ජලාපවහන මණ්ඩලයට අයිසීබී - 03 කොන්ත්‍රාත්තුව යටතේ නල එලීම සිදු කිරීමට නොහැකි විය. අයිසීබී 03 කොන්ත්‍රාත්තුව 2020 ඔක්තෝම්බර් 07 දින නැවත ආරම්භ කරන ලදී. | අඩුපාඩුව නිවැරදි කිරීමට පියවරගත යුතුය. |

## 3 භෞතික කාර්ය සාධනය

### 3.1 ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් පිළිබඳ භෞතික ප්‍රගතිය

ව්‍යාපෘතිය එහි ක්‍රියාකාරකම් කටයුතු 2014 සැප්තැම්බර් 29 වන දින ආරම්භ කර ඇති අතර එය 2019 ජුනි 30 දිනට අවසන් කිරීමට සැලසුම් කර ඇත.කෙසේ වෙතත්, නියමිත කාල සීමාව තුල ඉලක්ක සපුරාගැනීමට අපොහොසත් වීමට හේතුවෙන් ව්‍යාපෘතියේ කාල සීමාව 2022 මැයි 31 දක්වා දීර්ඝ කර තිබුණි. ව්‍යාපෘතියේ ප්‍රගති වාර්තාවලට අනුව 2020 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ සමස්ථ භෞතික ප්‍රගතිය සියයට 38.46 ක් විය. සමාලෝචිත වර්ෂය තුළදී ව්‍යාපෘතියේ ප්‍රගතිය අත්කරගෙන ඇත්තේ සියයට 15.36 ක් පමණි. ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් අනුව භෞතික ප්‍රගතිය පහත පරිදි වේ.

| අංකය | ක්‍රියාකාරකම් | ඒකක | අපේක්ෂිත ඉලක්ක | 2020 දෙසැම්බර් 31 දිනට ළඟාකරගත් ඉලක්ක | විගණන නිරීක්ෂණ | කළමනාකරනයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශ |
| --- | --- | --- | --- | --- | --- | --- | --- |
| (අ) | කි.මී. 5ක් සඳහා මි.මී.1,200 මෘදුයකඩ නල සැපයීම සහ එලීම ඇතුළු 1,500 m3 ගොතටුව ජලාශය හා මොරගස්මුල්ල අධි පීඩන බලැති පොම්පාගාරයක් ඉදිකිරීම. (අයිසීබී - 03) | ප්‍රතිශතය | 8 | 3 | කොන්ත්‍රාත් කාලය සහ ව්‍යාපෘති කාලය යන දෙකම දීර්ඝකිරීමේ හැකියාව. | එකඟ වේ . | කාල රාමුව තුළ වැඩ නිමකිරීම සඳහා වැඩ සමීපව අධීක්ෂණය කළ යුතුය. |
| (ආ) | අඹතලේ සිට එලි හවුස් ජලාශය දක්වා කි.මී.9 ක මෘදු යකඩ ජලනල (මි.මී. 1200 විෂ්කම්භය) හා උපාංග සපයා එලීම් කිරීම (අයිසීබී - 04) | | | | කොන්ත්‍රාත් කාලය දීර්ඝ විය හැකි අතර ව්‍යාපෘතියේ නිමාවට අහිතකර ලෙස බලපායි. | එකඟ වේ. ප්‍රමාදයන් සිදුවූයේ කොන්ත්‍රාත්කරුගේ අඩු කාර්ය සාධනය සහ කොවිඩ් 19 වසංගතය. | සංශෝධිත කාල රාමුව තුළදී නිම කිරීම සඳහා නිතිපතා වැඩ කටයුතු සමීපව අධීක්ෂණය කිරීම අවශ්‍ය වේ. |
| | ➢ නළ එලීම | මීටර් | 8,431 | 4,916 | | | |
| | ➢ සම්පීඩන පරීක්ෂාව | මීටර් | 7,163 | 714 | | | |
| | සමස්ථ භෞතික ප්‍රගතිය | ප්‍රතිශතය | 100 | 53.20 | | | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (ඇ ) | අඹතලේ පහසුකම්වල විශ්වාසනීයත්වය වැඩිදියුණු කිරීම හා බලශක්තිය ඉතිරිකිරීම සඳහා සුදුසු ධාරිතාවයකින් යුතු කාර්යක්ෂම පොම්ප ස්ථාපනය කිරීම, ඝර්ෂණය අඩු කිරීම සහ අනෙකුත් නිෂ්පාදන පහසුකම් වැඩි කිරීම තුලින්සම්ප්‍රේෂණ අලාභ අවම කිරීම. (අයිසීබී - 05) | ප්‍රතිශතය | 100 | 33.22 | ව්‍යාපෘතිය යටතේ සම්ප්‍රේෂණ අලාභ අවම කිරීම සහ බලශක්ති ඉතිරිකිරීම් සාක්ෂාත් කර ගැනීම ප්‍රමාද වීම. | එකඟ වේ. කොන්ත්‍රාත්කරුගේ දුර්වල ක්‍රියාකාරීත්වය හේතුවෙන් මෙම ප්‍රමාදයන් සිදුවේ. | සංශෝධිත කාල රාමුව තුළදී නිම කිරීම සඳහා නිතිපතා වැඩ කටයුතු සමීපව අධීක්ෂණය කිරීම අවශ්‍ය වේ. |
| (ඈ) | නිර්මාණ සමාලෝචනය සහ ඉදිකිරීම් අධීක්ෂණ උපදේශන සේවා (ඩීආර්සීඑස්සී) | අපේක්ෂිත උපදේශන සේවාව සැලසුම්කල කොන්ත්‍රාත් කාලය තුල ව්‍යාපෘතියට ලබාගැනීමට නොහැකි විය. එහි ප්‍රතිඵලයක් ලෙස උපදේශන කොන්ත්‍රාත්තුවේ කාලය 2022 පෙබරවාරි 28 දක්වා දෙවරක් දීර්ඝ කර තිබුණි. | | | ව්‍යාපෘතියේ උපදේශන කාලය දීර්ඝ කිරීම. | එකඟ වේ. ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවල ප්‍රමාදයන් හේතුවෙන් උපදේශන කොන්ත්‍රාත්තුව දීර්ඝ කරන ලදී. | ව්‍යාපෘතිය සංශෝධිත කාලසීමාව තුලදී නිම කිරීම සඳහා වැඩ වේගවත් කිරීම සහ කොන්ත්‍රාත්කරුවන්ගේ වැඩ නිතිපතා අධීක්ෂණය කිරීම සඳහා උපදේශක විසින් පිළියම් යෙදිය යුතුය. |

## 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
| --- | --- | --- | --- |
| (අ) | ව්‍යාපෘතියේ සිවිල් ඉදිකිරීම් කටයුතු එකඟ වූ කාලය තුල අවසන්කර නොතිබූ අතර එම ප්‍රමාදයට නිර්මාණ සමාලෝචනය සහ ඉදිකිරීම් අධීක්ෂණ උපදේශන සේවාව වගකිවයුතු නමුත් එම තත්ත්වය නොසලකා කොන්ත්‍රාත් කාලය 2022 ඔක්තෝම්බර් 22 දක්වා දීර්ඝ කර තිබුණි. | ප්‍රමාදය හා සම්බන්ධ සමහර ගැටළු ව්‍යාපෘතියට පාලනය කල නොහැකි විය. අරමුදල් අත්හිටුවීම, අයවැය ප්‍රතිපාදන ලබාගත නොහැකි වීම සහ කොවිඩ් 19 වසංගතය උදාහරණ කිහිපයකි. පීඑම්යූ, උපදේශක සහ පීඅයියූ එම තත්ත්වය මැනවින් අධීක්ෂණය කර ව්‍යාපෘති කාලය දීර්ඝ කර ඇත. | ප්‍රමාදවීම් සඳහා වන ගැටළු වැලැක්වීමට පිළියම් යෙදීමට හා කොන්ත්‍රාත්කරුවන්ගේ වැඩ සමීපව අධීක්ෂණය කිරීමට උපදේශකවරයා මැදිහත් විය යුතුය. |
| (ආ) | නළ සැපයීම හා එලීම ඇතුළුව භූගත ජලාශය සහ අධිපීඩන බලැති පොම්පාගාරය ඉදිකිරීමේ නව කොන්ත්‍රාත්තුවෙහි කටයුතු 2020 ඔක්තෝම්බර් 07 දින ආරම්භ කර 2022 ජූනි 06 දින අවසන් කිරීමට නියමිතව තිබුණි. කොන්ත්‍රාත්තුවේ ප්‍රගති වාර්තාවට අනුව 2020 දෙසැම්බර් 31 දිනට ඉලක්කගත ප්‍රගතිය සියයට 08ට සාපේක්ෂව සියයට 03 ක සමස්ථ භෞතික ප්‍රගතියක් පෙන්නුම් කර තිබූ අතර 2021 ජූනි 30 දිනට එය සියයට 16.58 ක් ලෙස පැවැතිණි. එබැවින්, කොන්ත්‍රාත් කාලය තුල කොන්ත්‍රාත්තුව අවසන් කිරීමේ හැකියාව සැක සහිතය. | එකඟ වේ.පහත සඳහන් හේතු නිසා ප්‍රමාදයන් සිදුවිය.<br><br>කොන්ත්‍රාත්කරුගේ කාර්යසාධනය ඉතා දුර්වල වීම, ආනයනික ද්‍රව්‍ය සැපයීම සඳහා ණයවරලිපි විවෘත කිරීමට කොන්ත්‍රාත්කරුට නොහැකි වීම. කොවිඩ් 19 වසංගතය නිසා කොන්ත්‍රාත් ප්‍රගතියට දැඩි ලෙස බලපෑම් ඇති වීම. | කොන්ත්‍රාත්කරු ගේ වැඩ කටයුතු නිරන්තරව අධීක්ෂණය කිරීම අවශ්‍ය වන අතර එම කටයුතු කඩිනම් කිරීම සඳහා පිළියම් යෙදිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | අඹතලේ නිෂ්පාදන පහසුකම්වල විශ්වාසනීත්වය වැඩි දියුණු කිරීම සහ සුදුසු ධාරිතාවයකින් යුත් කාර්යක්ෂම පොම්ප ස්ථාපනය කිරීම තුලින් බලශක්තිය ඉතිරි කිරීමේ කොන්ත්‍රාත්තුවේ ප්‍රගති වාර්තාවට අනුව, අපේක්ෂිත සියයට 100 ක භෞතික ප්‍රගතියට සාපේක්ෂව 2020 දෙසැම්බර් 31 දිනට සමස්ථ භෞතික ප්‍රගතිය සියයට 33.22 ක මන්දගාමී ප්‍රගතියක් පෙන්නුම් කර තිබුණි. වැඩ කඩිනමින් කිරීමට පීඑම්යූ විසින් කොන්ත්‍රාත්කරුට උපදෙස් ලබාදී තිබුණද 2021 මැයි 31 දක්වා ප්‍රගතිය සියයට 37.01 ක් ලෙස පැවතිණි. එබැවින් නියමිත කොන්ත්‍රාත් කාලය තුලදී කොන්ත්‍රාත්තුව අවසන් කිරීමේ හැකියාව සැක සහිතය. | අයි.සී.බී 05 කොන්ත්‍රාත්තුව 2021 මාර්තු 12 දිනෙන් අවසන්වීමට නියමිතව තිබූ අතර 2021 සැත්තැම්බර් 01 දින දක්වා කාලය දීර්ඝ කිරීමට අවසර දෙනලදී. 4.1.3 හි සඳහන් හේතු අයි.සී.බී 05 කොන්ත්‍රාත්තුව ප්‍රමාදවීමට හේතු විය. | කොන්ත්‍රාත්කරු ගේ වැඩ කටයුතු නිතිපතා අධීක්ෂණය කිරීම අවශ්‍ය වන අතර එම කටයුතු කඩිනම් කිරීම සඳහා පිළියම් යෙදිය යුතුය. |
| (ඈ) | අඹතලේ සිට එලිහවුස් දක්වා කි.මී.9 මෘදුයකඩ නල (මි.මී.1200 ක විෂ්කම්භය) සපයා එලීමේ කොන්ත්‍රාත්තුවේ (අයිසීබී 04) 2020 දෙසැම්බර් 31 දිනට ඉලක්කගත ප්‍රගතිය සියයට 88.98 ක සාපේක්ෂව සියයට 53.20 ක මන්දගාමී ප්‍රගතියක් පෙන්නුම් කර තිබුණේ කොන්ත්‍රාත්තුව ආරම්භ වී වසර 04 කුත් මාස 05 ක් ගත වී තිබියදීය. තවද, මීටර් 2,450 ක මාර්ග කොටසක නල එලීම් සම්පූර්ණයෙන් නිම කර ආර්ඩීඒ වෙත භාරදී ඇත. එසේ වුවද, නල නැවීම් ප්‍රතිසංස්කරණ කටයුතු හා සම්පීඩන පරීක්ෂා ප්‍රමාද වීම හේතුවෙන් 2018 වර්ෂයේ එලීම් කරන ලද මීටර් 360 ක් 2021 ජූනි 30 දින වන තෙක් නිමකර නොතිබූ බව නිරීක්ෂණය විය. | ඒඑෆ්ඩී ණය පහසුකම් තාවකාලිකව අත්හිටවූ නිසා අන්තර් බිල්පත් ගෙවීම් නොකිරීම හේතුවෙන් 2018 සැප්තැම්බර් 01 දින මෙම කොන්ත්‍රාත්තුව අවසන් කරන ලදී. එසේම, වසර 01කුත් මාස 03 කට පසුව 2019 නොවැම්බර් 25 දින කොන්ත්‍රාත්තුව නැවත ආරම්භ කරන ලදී. එසේම, කොවිඩ්-19 වසංගතයද කොන්ත්‍රාත්තුවේ ප්‍රගතියට දැඩිලෙස බලපෑම් එල්ල විය. එසේම, කොන්ත්‍රාත්තුවේ ප්‍රමාදයන් සඳහා 4.1.2 හි සඳහන් හේතු ද අදාල වේ. | කොන්ත්‍රාත්කරුගේ වැඩ නිතිපතා අධීක්ෂණය කිරීම අවශ්‍ය වන අතර එම කටයුතු කඩිනම් කිරීම සඳහා පිළියම් යෙදිය යුතුය. |

**3.3 වැඩ බිම් ක්ෂේත්‍ර පරික්ෂාවේදී සිදුකරන ලද නිරීක්ෂණයන්**

| අංකය | විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | 2021 ජූලි 27 දින අයිසීබී 05 කොන්ත්‍රාත්තුවෙහි කාර්යමණ්ඩල නේවාසික ගොඩනැගිල්ල හා මධ්‍යම පාලන ගොඩනැගිල්ලට අදාලව සිදුකරන ලද භෞතික විගණන පරීක්ෂාවට අනුව, කාර්යමණ්ඩල නේවාසික ගොඩනැගිල්ලේ සිවිල් කටයුතු, විදුලිරැහැන් වැඩ සහ උපකරණ සවිකිරීම සහ මධ්‍යම පාලන ගොඩනැලිල්ට අදාල පද්ධතියේ පරීක්ෂා කිරීම් සහ ක්‍රියාත්මක කිරීම් 2021 ජූලි 27 දින දක්වාත් අවසන් කර නොතිබුණි. ඊට අමතරව, භූගත | අයිසීබී 05 කොන්ත්‍රාත්තුවේ යෝජිත කාර්යමණ්ඩල නේවාසික සහ පාලන ගොඩනැගිල්ලේ ප්‍රගතිය වේගවත් කිරීම සඳහා කොන්ත්‍රාත්කරුට අවශ්‍ය උපදෙස් ලබා දී ඇත. එසේම, කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් ශ්‍රමය, උපකරණ සහ ද්‍රව්‍යමය | කොන්ත්‍රාත්කරුගේ වැඩ නිතිපතා අධීක්ෂණය කිරීමට පියවර ගත යුතු අතර ශ්‍රම බලකාය වැඩි කිරීම සහ වැඩ වේගවත් කිරීම සඳහා වැඩිදුර උපදෙස් ලබාදිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ජලාශයේ පයිලින් (Pilling)වැඩ පවා ක්ෂේත්‍ර පරීක්ෂණ දින දක්වා අවසන් කර නොතිබුණි. කෙසේ වෙතත්, මෙම වැඩබිම සඳහා අඩු ශ්‍රමික පිරිසක් යොදවා ඇති බව නිරීක්ෂණය විය. | සැපයුමේ ගැටළු පවතී. | |
| | නළ සැපයීම හා එලීම ඇතුළුව භූගත ජලාශය සහ අධිපීඩන බලැති පොම්පාගාරය ඉදිකිරීම කොන්ත්‍රාත්තුවෙහි **2021** ජූලි **27** දින සිදුකරන ලද භෞතික විගණන පරීක්ෂාවට අනුව ඉදිකිරීම් කටයුතු වැඩ සැලැස්මට අනුකූල නොවන බව නිරීක්ෂණය විය. තවද, විගණිත දිනයේදී මොරගස්මුල්ල අධිපීඩන බලැති පොම්පාගාරයේ කිසිඳු ඉදිකිරීම් කටයුත්තක කිසිවෙකු නිරතව නොසිටි බව නිරීක්ෂණය විය. | | |
| (ආ) | | එකඟ වේ. | |
| | | කොන්ත්‍රාත්කරුගේ කාර්යසාධනය අවශ්‍ය මට්ටමට නොපැමිණි අතර ප්‍රමාදය මගහරවාගැනීමට අවශ්‍ය උපදෙස් කොන්ත්‍රාත්කරුට ලබාදී ඇත. අධිපීඩන පොම්පාගාරයේ සේවකයින් නොමැතිවීම සඳහා හේතුව වනුයේ, කොන්ත්‍රාත්කරුගේ අංගනයේ වැරගැන්වීම් කම්බි නැවීමේ (reinforcement bar bending) කටයුතුවල කම්කරුවන් නිරත වීමයි. | ප්‍රමාණවත් ශ්‍රම බලකාය යෙදවීමට හා වැඩ වේගවත් කිරීමට උපදෙස් ලබාදිය යුතු අතර කොන්ත්‍රාත්කරුගේ වැඩ නිරතුරුවම අධීක්ෂණය කිරීමට පියවර ගත යුතුය. |

## 3.4 මතභේදයට තුඩුදුන් කරුණු

| අංකය | විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතිය යටතේ **2019** දෙසැම්බර් **31** දින වන විට අඹතලේ ජල පවිත්‍රාගාරයේ අධික බලශක්ති පිරිවැය අඩුකිරීමට, සර්ෂණය අලාභ අවම කිරීම සඳහා අඩු කාර්යක්ෂමතාවයෙන් යුතු පොම්ප ප්‍රතිසංස්කරණය කර ප්‍රතිස්ථාපනය කිරීමට සහ භූගත ජලාශයක් ඉදිකිරීමට සහ විශාල විෂ්කම්භයකින් යුතු සම්ප්‍රේෂණ ජාලයක් ස්ථාපනය කිරීමට ජාතික ජල | එකඟ වේ. | ව්‍යාපෘතිය සංශෝධිත කාලසීමාව තුළදී නිම කිරීමට උපරිම උත්සහයක් ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සැලැසුම් කර තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘතිය යටතේ කිසිදු කොන්ත්‍රාත්තුවක් 2020 දෙසැම්බර් 31 දක්වාත් අවසන් කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, 2020 වර්ෂය අවසානය වන විට අඹතලේ ජල පවිත්‍රාගාරයේ මාසික සාමාන්‍ය විදුලි ගාස්තුව රු.මිලියන 67.52 ක් ලෙස පැවැතුණු අතර ඉහත සැලැසුම් කල පරිදි අධික විදුලි ගාස්තුව අඩු කර ගත නොහැකි විය. | | |
| (ආ) | කොන්ත්‍රාත්තුවේ භෞතික ප්‍රගතිය කොන්ත්‍රාත්තුවේ ක්‍රියාකාරකම් ආරම්භ වූ දින සිට මාස 53 කට පසුවත් 2020 දෙසැම්බර් 31 දිනට සියයට 53.2 ක මන්දගාමී ප්‍රගතියක් පෙන්නුම් කර තිබියදීත් අත්හිටුවන ලද කාලසීමාව සඳහා වූ ලාභය අහිමි වීම් සහ ප්‍රමාද ගෙවීම් සහ කොවිඩ් 19 කාලය සඳහා අතිරේක ගාස්තු ආදිය යටතේ එකතුව වූ රු.මිලියන 1,115.94 ක හිමිකම් ඉල්ලා ඇති අතර 2020 දෙසැම්බර් 31 දිනට එයින් රු.මිලියන 25.63 ක් කොන්ත්‍රාත්කරු විසින් හිමිකම් ලබාගෙන තිබුණි. | කොන්ත්‍රාත්කරුගේ බොහෝ හිමිකම් පැම් සිදුවී තිබුණේ ගෙවීම් ප්‍රමාදවීම සහ කොවිඩ්-19 වසංගතය හේතුවෙනි. | ආරවුල්, ගැටුම් සහ ගෙවීම් ප්‍රමාද වීම් යනාදිය වැලැක්වීම සඳහා පිළියම් යෙදිය යුතු අතර නියමිත කාල සීමාව තුළ වැඩ නිම කිරීම සඳහා නිතිපතා වැඩ අධීක්ෂණය කළ යුතුය. |

**3.5 ඌණ උපයෝජිත සම්පත්**

| අංකය | විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | ණය නියෝජිතායතනය මඟින් ඇ.ඩො.මිලියන 70 කට සමාන රු.මිලියන 9,100 ක් මූල්‍යනය කිරීමට එකඟ වී තිබියදීත්, ව්‍යාපෘති කටයුතු ආරම්භ කළ දින සිට වසර 06 කුත් මාස 03 ක් ගතවී ඇතත් 2020 දෙසැම්බර් 31 දිනට අරමුදල් වලින් සියයට 24 ක් නියෝජනය කරමින් රු.මිලියන 2,792 ට සමාන ඇ.ඩොලර් මිලියන 16.68 ක මුදලක් පමණක් උපයෝජනය කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, 2020 දෙසැම්බර් 31 දක්වා උපයෝජනය නොකල ශේෂය වෙනුවෙන් රු.මිලියන 308.27 කට සමාන ඇ.ඩො.මිලියන 1.93 ක් බැඳීම් ගාස්තු ලෙස ගෙවා තිබුණි. | 4.3 සහ 4.4 වගන්තිවල සාකච්ජා කර ඇති සියළුම හේතූන් විියපැහැදම් කිරීම් ප්‍රමාදවීමට හේතු විය. | ව්‍යාපෘතියේ සියළුම කටයුතු දීර්ඝ කරන ලද කාල සීමාව තුළදී නිම කිරීමට උපරිම උත්සහයක් ගත යුතුය. |

**3.6 පද්ධති සහ පාලන**

| අංකය | විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | අයිසීබී 03 කොන්ත්‍රාත්තුවට අදාලව විචලතා කමිටුව මඟින් වටිනාකම වූ රු.මිලියන 158.70 ක් වූ විචලතා නියෝග 45 ක් අනුමත කර තිබූ නමුත් ව්‍යාපෘතිය මඟින් විචලතා කමිටුවේ අනුමැතිය ලබානොගෙන 2020 දෙසැම්බර් 31 දක්වා රු.මිලියන 38.64 ක් වැඩියෙන් ගෙවා තිබුණි. කෙසේ වෙතත්, එම මුදල 2021 මැයි 31 දින දක්වා රු.මිලියන 77.67 දක්වා වැඩි වී තිබුණි. | රේටයන් හා මිල කොන්ත්‍රාත්කරු හා ඉංජිනේරුවරයා එකඟ වන තුරු කොන්ත්‍රාත්කරු විසින් සිදුකරනු ලබන වැඩ සඳහා විචලතා කමිටුවලින් අනුමැතීන් ලබානොගෙන කරගෙන යාමට හා සහතික කරන ලද සියලුම ගෙවීම් වලට පදනම් වී තිබුණේ එවැනි විචලනයන් සඳහා ව්‍යාපෘති ඇගයීම් මත හා සාමානාහාධිකාරීගේ (ජා.ජ.ස.ම) අනුමැතිය ව්‍යාපෘතිය විසින් ලබාගැනීමෙනි. | දිගු කාලයක් ප්‍රමාණ හා මිල සාකච්චා කිරීම විචලතා කමිටු අනුමැතිය ලබාගැනීම සඳහා ඵලදායී යාන්ත්‍රණයක් ස්ථාපිත කල යුතුය. |
| (ආ) | 2018 වර්ෂයේදී අයිසීබී 05 කොන්ත්‍රාත්කරුට වැඩපූර්ව අත්තිකාරම් ලෙස ඇ.ඩො.මිලියන 2.87 කට සමාන රු.මිලියන 514.79 ක් ගෙවා තිබුණි. 2020 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත්තුව අවසන් වීමට තිබියදීත් අඩු ප්‍රගතිය හේතුවෙන් 2020 දෙසැම්බර් 31 දිනට කිසිඳු වැඩ පූර්ව අත්තිකාරමක් අයකර ගෙන නොතිබුණි. | සෑම ගෙවීම් සහතිකයින්ම අත්තිකාරම් ගෙවීම ස්වයංක්‍රීයව අය කෙරේ. 2021 මාර්තු මාසය සඳහා ඉදිරිපත් කරන ලද අන්තර්ගෙවීම් බිල්පත් අංක 05 ට (IPC-05)අනුව ඇ.ඩොලර් 128,958.60 ක් අයකරගෙන තිබුණි. | නියමිත වැඩ සැලැස්මට අනුකූලව කාලය දීර්ඝ කිරීමකින් තොරව ඉදිකිරීම් සිදුකර අවසන් කල යුතුය. |
| (ඇ) | කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ 2010 ජුලි 26 දිනැති අංක 05 දරණ චක්‍රලේඛයට අනුව ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අභ්‍යන්තර විගණනය විසින් ව්‍යාපෘතියේ ගනුදෙනු විගණනය කර නොතිබුණි. | එය ව්‍යාපෘතියේ පාලනයෙන් ඔබ්බටය | අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කල යුතුය. |